සුරාබද්දු කොමසාරිස් ජනරාල්
ஆணையாளர் நாயகம்
Commissioner General
3888022
3888023

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පරිපාලන)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமானக் கொள்கை, நிர்வாகம்))
Additional Commissioner General (Revenue Policy & Admin)
2877891

අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් මෙහෙයුම් හා නීති ක්‍රියාත්මක කිරීම)
மேலதிக ஆணையாளர் நாயகம் (வருமான முகமைத்துவம், சட்டவலுப்படுத்தல்)
Additional Commissioner General (Revenue Management&Law Enforcement)
2045050

ෆැක්ස්
பெக்ஸ்
Fax
2877890

ඊ-මේල්
மின்னஞ்சல்
E-Mail
excisen@slt.lk


# ශ්‍රී ලංකා සුරාබදු දෙපාර්තමේන්තුව
# இலங்கை மதுவரித் திணைக்களம்
# EXCISE DEPARTMENT OF SRI LANKA


දුරකථන අංකය
தொலைபேசி எண்.
Telephone No
2045000

අංක 353, කෝට්ටේ පාර. රාජගිරිය. இல.353,கோட்டை வீதி,இராஜகிரிய.No 353, Kotte Road, Rajagiriya.


මගේ අංකය.
எனது இல:
My No.
ED/02/06/02/2021

ඔබේ අංකය.
உமது இல:
Your No.

දිනය
திகதி
Date
2020.11. 26

සහකාර සුරාබදු කොමසාරිස් /සුරාබදු අධිකාරි/සුරාබදු ස්ථානාධිපති මහින්,
අදාළ නිලධාරීන් වෙත.

<u>වාර්ෂික ස්ථාන මාරුවීම් - 2021</u>
<u>සුරාබදු සැරයන් මේජර්/සැරයන්/කෝප්‍රල්/නියාමක/කාන්තා නියාමක/නියාමක රියදුරු</u>

මගේ සමාංක හා 2020.08.12 දිනැති නිවේදනය අනුව 2021 වාර්ෂික ස්ථාන මාරුවීම් සඳහා ඔබ විසින් ඉදිරිපත් කරන ලද අයදුම්පත සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුවේ ස්ථාන මාරු මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණ අනුව මේ සමඟ ඇති උපලේඛනයේ සඳහන් ස්ථාන මාරුවීම් 2021.01.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙයින් නිවේදනය කරනු ලැබේ.

02. මෙම ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක කිරීමේදී සියලුම නිලධාරීන් 2021.01.01 දින නව සේවා ස්ථානවලට වාර්තා කිරීමට හැකි වන පරිදි දැනට තමන් අයත් ජ්‍යෙෂ්ඨතම නිලධාරියාගේ පූර්ව අනුමැතිය ඇතිව ස්ථාන මාරුවී යාමට ක්‍රියා කළ යුතු ය. නව සේවා ස්ථානයට පිටත්ව යාමට පෙර තමන් භාරයේ ඇති රජයේ බඩු බාහිරාදිය සහ ලිපිලේඛන නිසි පරිදි භාරදිය යුතු ය. අධිකරණ නඩුවලට අදාල ලියකියවිලි සුදුසු නිලධාරියෙකුට ලිඛිතව භාරදිය යුතු ය.

03. ස්ථාන මාරුවීම් ක්‍රියාත්මක වන දිනෙන් ඔබ්බට කිසිදු නිලධාරියෙකු සඳහා සේවා ස්ථානයක ප්‍රධානියෙකු විසින් නිවාඩු අනුමත නොකළ යුතු ය. යම් හෙයකින් නව සේවා ස්ථානයට වාර්තා කිරීමට නියමිත දින සිට නිවාඩු අවශ්‍ය වුවහොත් ඒ බව නව සේවා ස්ථානයේ ප්‍රධානියාට දන්වා නිවාඩු ලබා ගත යුතු ය. අසනීප නිවාඩු ලබා ගතහොත් ආසන්න රජයේ රෝහලක වෛද්‍ය නිලධාරියෙකු විසින් නිකුත් කළ වෛද්‍ය සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වුවහොත් එම දිනයන් වැටුප් රහිත නිවාඩු සේ සලකා කටයුතු කිරීමට හෝ සේවය අතහැර ගිය අයෙකු සේ සැලකීමට හෝ වෙනත් විනය ක්‍රියා මාර්ගයකට භාජනය කිරීමට සිදු වනු ඇත.

04. නව සේවා ස්ථානවල රාජකාරී සඳහා වාර්තා කළ විගස ඒ බැව් එදිනම සුරාබදු ස්ථානාධිපති, සුරාබදු අධිකාරී සහ සහකාර සුරාබදු කොමසාරිස් මහින් මා වෙත වාර්තා කිරීම අත්‍යාවශ්‍ය වේ.

05. අදාල ස්ථානාධිපතිවරුන් තමන් යටතේ සේවය කරනු ලබන ස්ථාන මාරුවීම් ලබා සිටින නිලධාරීන්ට ඔවුන්ගේ ස්ථාන මාරුවීම් නියෝග ලිඛිතව දැන්විය යුතු ය. නිලධාරීන් ස්ථාන මාරු වී යාමට පෙර වරෙන්තුකරුවන් සම්බන්ධ කටයුතු අවසන් කර ගැනීමට ක්‍රියා කළ යුතු ය.

06. නිවේදනය කර ඇති ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් අභියාචනා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරන නිලධාරීන් තම අභියාචනා අදාල බලධාරීන්ගේ නිරීක්ෂණ හා නිර්දේශයන් සහිතව 2020.12.10 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ඉදිරිපත් කළ යුතු ය. එදිනට පසුව ලැබෙන අභියාචනා සහ ස්ථාන මාරු අයදුම්පත්‍රයේ සඳහන් කාරණාවලට ඇතුළත් නොවන හේතූන් ඉදිරිපත් කරන අභියාචනා සලකා බලනු නොලැබේ.

07. දැනට සේවය කරන කාර්ය ස්ථානයේ නියමිත කාලය සම්පූර්ණ කර නොමැති නිලධාරීන්ට මෙම වාර්ෂික ස්ථාන මාරුව වෙනුවෙන් ගමන් වියදම් ගෙවනු නොලැබේ. නියමිත කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන්ට ආයතන සංග්‍රහයේ විධිවිධානවලට යටත්ව ගමන් වියදම් ගෙවිය හැකි අතර උපවේශන දීමනා ගෙවනු නොලැබේ.

ඒ. බෝදරගම
සුරාබදු කොමසාරිස් ජනරාල්

පිටපත් :

1. අතිරේක සුරාබදු කොමසාරිස් ජනරාල් (ආදායම් ප්‍රතිපත්ති හා පරිපාලන) - කා.දැ.ස.
2. ප්‍රධාන ගණකාධිකාරී - කා.දැ.ස.
3. සියලුම සුරාබදු කොමසාරිස්වරුන් - කා.දැ.ස.
4. සියලුම නියෝජ්‍ය සුරාබදු කොමසාරිස්වරුන් - කා.දැ.ස.
5. අදාල වෘත්තීය සමිතිවල ලේකම්වරුන් - කා.දැ.ස.